# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2014 ජූලි මස 08 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාප්‍රවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් 2014.06.03 දින අසන ලද ප්‍රශ්ණය; (ප්‍ර/VI (1) /14/03)

(අ) පළාත් මාර්ග ගණනාවක් සංවර්ධනය කිරීමේදී මාර්ග දෙපස ජනතාව වන්දි ලබාගැනීමකින් තොරව තම ඉඩමේ ප්‍රමාණයක් පාර සංවර්ධනයට නිදහස් කළ ස්ථාන ඇති බව පිළිගන්නේද?

(ආ) එකී ස්ථාන වල මාර්ගය පුළුල් කළද විදුලි කණු, දුරකථන කණු, එලෙසින්ම පවතින බව පිළිගන්නේද?

(ඇ) මාර්ගය ලෙස භාවිතා වන සීමාවේ මෙම කණු පැවතීමෙන් එය අනතුරුදායක තත්වයක් බව පිළිගන්නේද?

(ඈ) එකී අනතුරුදායක තත්වය වෙනස් කිරීමට ගන්නා වූ පියවර කවරේද?

(ඉ) නොඑසේනම් ඒ මන්ද?

02. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.03 දින අසන ලද ප්‍රශ්ණය: (ප්‍ර/VI (1) /14/07)

(අ) බස්නාහිර පළාතේ නොතාරිස්වරුන් ලියා සහතික කරනු ලබන ඔප්පු සදහා මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය හා එහි සංශෝධන අනුව බව ඔබතුමා පිළිගන්නේද?

(ආ) නොතාරිස්වරු ලියා සහතික කරන ඔප්පුවල ඇතුලත් ඉඩම් තක්සේරු කිරීම සදහා නිසි බලයක් බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියෙහි ඇතුලත්ව ඇත්ද? එසේ ඇතුලත් වන්නේ නම් ඒ කුමන වගන්තීන් වලද?

(ඇ) නොතාරිස්වරු විසින් ඔප්පු වල ඇතුලත්කල ප්‍රතිෂ්ඨාවන් ඇභිබවා යමින් මුදලක් තක්සේරු කිරීම සදහා උක්ත ප්‍රඥප්තියෙන් බලය පැවරී ඇත්ද?

(ඇ) බස්නාහිර පලාතේ, ආදායම් දෙපාර්තුමේන්තුවේ තක්සේරු ඒකකයක් හෝ කිහිපයක් පවතින්නේද? එම තක්සේරුවන්ගේ නම් හා නිශ්චල දේපල තක්සේරු කිරීමට අදාලව ඔවුන්ගේ සුදුසුකම් කවරේද?

(ඉ) එලෙස නිශ්චල දේපල තක්සේරු කිරීමට නිසි සුදුසුකම් තිබේනම් නිශ්චල දේපල තක්සේරු කිරීමට භාවිතා කරනු , ලබන නිර්නායක කවරේද?

(ඊ) වටිනාකම මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව තීරණය කිරීම සදහා දැනට බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවේ ඇති ක්‍රමවේදය කුමක්ද?

(උ) මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම ආරම්භ කලේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය සම්මත වී වසර කියකට පසුවද? ප්‍රථමයෙන් ක්‍රියාත්මක කල වර්ෂය කුමක්ද?

03. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.17 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /14/11)

(අ) කොලඹ මහ නගර සභාවට අයත් ලිපිගොනු රාශියක් බොරැල්ල කනත්තේ දී වර්ෂ 2013 අගොස්තු 17 වන දින පුළුස්සා විනාශ කරන ලද්දේද?

(ආ) එම පිලිස්සීම සදහා ගරු නගරාධිපතිතුමාගේ / නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ / මහ සභාවේ / ආයතන කමිටුවේ අවසරය ගෙන තිබුණේද? නැතහොත් අවම තරමින් ඔවුන් හෝ එම අයතනයන් දැනුවත් කර තිබුනේද?

(ඇ) එම පිලිස්සීමෙන් පහත නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

1) ජාතික ලෙඛනාරක්ෂක පනතේ 16(1) (අ)' , 16(1)(ආ)ප්‍රතිපාදන

11) ආයතන සංග්‍රහයේ පළවන කාණ්ඩයේ xxviii ජේදයේ 9.6 සහ 9.8 වගන්තිවල ප්‍රතිපාදන

111) මහ නගර සභා අඥා පනතේ 172 වගන්තිය

(ඈ) එම ලිපි ගොනු ජාතික ලේඛනාරක්ෂක පනතේ 16(1) (අ)', 16 (1)(ආ) හි නියෝග 301 න් කුමකට අදාළද?

(ඉ) ආයතන සංග්‍රහයේ 9,6 වගන්තිය අනුව අංක යෙදීම අනිවාර්ය බව ඔබතුමා පිළිගන්නේද?

(ඊ) පුළුස්සන ලද ලිපිලේඛන ඇතුළත් ඉදිරිපත් කරන ලද ලේඛනයේ අංක 54 සිට 126 දක්වා ලිපිගොනුවල අනු අංකය වෙනුවට ඉරිකැල්ලක් පමණක් ඇති බව ඔබතුමා දන්නේද?

(උ) උක්ත ගැටළුවට අදාලව පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයන්හි වත්මන් ප්‍රගතිය කුමක්ද?

04. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නිතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.17 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/VI (1) /14/12)

(අ) වත්තල ප්‍රාදේශිය සභාවට අයත් අල්විස්වත්ත සාගර ක්‍රීඩා පිටියට (ප්‍රාදේශිය සභා ක්‍රීඩා පිටිය) අප්‍රේල් සිංහල දෙමළ අවුරුදුවලින් පසු දිනකදි බොරළු පස්, ටිපර් මගින් ගෙනවිත් තැනින් තැන ගොඩ ගසා ඇති බව ඔබ දන්නේද?

(ආ) දින 40 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුනද, එම පස් තුනීකර නොමැති නිසා ක්‍රීඩා කිරීමට ඇති ඉඩකඩ අවහිර වී ඇති බව පිලිගන්නේද?

(ඇ) එසේ නම් එම පස් තුනීකර එම ක්‍රීඩා පිටිය තුල ක්‍රීඩා කිරීමට හැකි ලෙස එය සකස් කිරීමට පියවර ගන්නේද?

(ඈ) එසේ පියවර ගනු ලබන්නේ කවදා සිටද?

05. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නිතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.06.17 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/VI (1) /14/13)

(අ) කොළඹ මහ නගර සභා සීමාව තුල පිහිටා තිබූ ශාන්ත ජෝන් මාළු වෙළදසැල පැලියගොඩට රැගෙන ගිය බව ඔබතුමා දන්නේද?

(ආ) රැගෙන යන විට එහි සිල්ලර වෙළදාම කල වෙළඳ ප්‍රජාව කොපමණද?

(ඇ) පැලියගොඩ නව මාළු වෙළද සංකීර්ණය විවෘත කරන අවස්ථාව වන විට සිල්ලර මාළු වෙළදසැල් කියක් වෙළද ප්‍රජාවට ලබාදුන්නේද?

(ඈ) එසේ ලබාදුන් සිල්ලර මාළු වෙළදසැල් කියක් වැසී ගොස් ඇද්ද?

(ඉ) එසේ වැසී ගොස් ඇත්තේ, වෙළදාමේ අවුකම නිසා බව ඔබතුමා පිලිගන්නේ ද?

(ඊ) මැනිං එළවළු වෙළද සැලද පැලියගොඩ ප්‍රදේශයට රැගෙන යාමට සැලැස්මක් පවතින්නේද?

(උ) එසේ වුවහොත් ඉහත (ඈ) සහ (ඉ) ඡේදවල අන්දමට වෙළදාම අඩුව වෙළදසැල් වැසී යාමේ තර්ජනයකට මුහුණදිම යථාර්ථය බව ඔබතුමා පිලිගන්නේද?

(ඌ) එසේ නම් එළවළු වෙළදාම සදහා හොඳ විකල්ප ස්ථානයක් යෝජනා නොකරන්නේ මන්ද?

06. ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුම විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /14/17)

(අ) 1. ඔබතුමාගේ අමාත්‍යංශයට අයත් මිනිස්බල හා රැකිරක්ෂා විෂය යටතේ ඇති කටයුතු කවරේද?

11. V වන පළාත් සභාව තුල එම විෂය යටතේ සිදුකළ ප්‍රධාන කාර්ය භාරයන් මොනවාද?

(ආ) 1. ඔබතුමාගේ අමාත්‍යංශය යටතේ ඉංජිනේරු සේවා විෂය යටතේ ඇති කටයුතු කවරේද?

11. V වන පළාත් සභාව තුල එම විෂයන් යටතේ සිදුකළ ප්‍රධාන කාර්ය භාරයන් මොනවාද?

(ඇ) 1. ඔබතුමාගේ අමාත්‍යංශයට අයත් ප්‍රවෘත්ති විෂය යටතේ ඇති කටයුතු කවරේද?

11. V වන පළාත් සභාව තුල එම විෂය යටතේ සිදුකළ ප්‍රධාන කාර්ය භාරයන් මොනවාද?

07. ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /14/18)

(අ) 1. ඔබතුමාගේ අමාත්‍යංශයට අයත් සංස්කෘතික හා කලා කටයුතු විෂය යටතේ ඇති කටයුතු කවරේද?

11. එම විෂයට අදාලව ස්ථාපිත ආයතන මොනවාද?

111. V වන පළාත් සභාව තුල එම විෂය යටතේ සිදුකළ ප්‍රධාන කාර්ය භාරයන් මොනවාද?

08. ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් ක්‍රම සම්පාදන, නිතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන පළාත්පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්‍ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/19)

(අ) බප/ගම් කිරිඳිවැල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ කඩා ඉවත් කරන ලද පැරණි ගොඩනැගිල්ල වෙනුවට යෝජිත නව සිව්මහල් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද ?

(ආ) එම ගොඩනැගිල්ල සඳහා මෙතෙක් වැය කර ඇති මුදල කොපමණද ? වෙන් කල මුදල කොපමණද ?

(ඇ) 2013 මැයි මාසයේදී ඔබතුමා විසින් මුල්ගල් තබා ආරම්භකරන ලද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට නැවතී ඇති බව ඔබතුමා දන්නවාද?

(ඈ) පැරණි ගොඩනැගිල්ලේ තිබූ පන්ති කාමර 6 ක දරුවන් සඳහා පාසැල ඉදිරිපිට ඇති බෞද්ධ මධ්‍යස්ථානයේ පන්ති පැවැත්වෙන අතර එම ගොඩනැගිල්ල නැවත අපසු ලබාදෙනමෙන් එහි පාලක මණ්ඩලය විසින් ඉල්ලා ඇති බව ඔබතුමා දන්නවාද ?

(ඉ) වර්ෂයකට අධික කාලයක් මෙම ස්ථානයේ ඉගෙනුම ලබන දරුවන්ට නිසි ආරක්‍ෂාවක් නොලැබෙන බව ඔබතුමා දන්නවාද?

(ඊ) යෝජිත නව සිව්මහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නියමිතව ඇත්තේ කවදාද ?

09. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නිතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්‍ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/20)

(අ) I. පළාත තුළ අධ්‍යාපන කලාප කීයත් තිබේද?
II. එම කලාපවලට විධිමත්ව පත් කරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු කීදෙනකු සිටීද?
III. වැඩ බලන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් කීදෙනෙකු සිටීද?
IV. සෑම කලාපයකට ම විධිමත් ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් නොකරන්නේ මන්ද?

(ආ) I. පළාත තුළ අධ්‍යාපන කලාප අනුව අධ්‍යාපන කොට්ඨාශ කීය බැගින් තිබේද?
II. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කී දෙනෙකු විධිමත්ව පත් කර තිබේද?
III. වැඩ බලන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කී දෙනෙකු සිටීද?
IV. සෑම අධ්‍යාපන කොට්ඨාශයකටම විධිමත් ලෙස කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරළුන් පත් නොකරන්නේ මන්ද?

(ඇ) I. කලාප අධ්‍යාපන කාර්යාලයක විවිධ විෂයන්ට අනුව සිටිය යුතු අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද?
II. ඒ ඒ විෂය අනුව අධ්‍යක්ෂවරුන් කීදෙනා බැගින් සිටිය යුතුද?
III. පළාතේ කලාප අධ්‍යාපන කාර්යාලවල මෙකී ප්‍රමාණයන් සම්පූර්ණ කර තිබේද?
IV. නොඑසේ නම් ඒ මන්ද?

10. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යොවන කටයුතු, කාන්තා කටයුතු ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/21)

(අ) කටාන විවිධ සේවා සමුපකාර සමිතියේ ඇති වූ වංචා දූෂණ රාශියක් මෙම සභාවේ හෙළිදරව් කිරීම අනුව කොමසාරිස් පාලනයට යටත් කරනු ලැබූ, එකී සමුපකාර සමිතියේ පරිපාලන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් සමුපකාර කොමසාරිස්වරයා විසින් මේ වන විට ඔබතුමා වෙත භාර දී තිබේද?

(ආ) එසේ නම්, සමුපකාර කොමසාරිස්වරයා විසින් සකස් කරන ලද එම වාර්තාව සභාගත කරන්නේද?

(ඇ) නොවසේ නම් ඒ මන්ද?

(ඈ) සමුපකාර කොමසාරිස්වරයා විසින් පරීක්ෂණ වාර්තාවක් මෙතෙක් භාර දී නොමැති නම් එම වාර්තාව ලබා ගැනීමට ඔබතුමා පියවර ගත්තේද?

(ඉ) නොඑසේනම් ඒ මන්ද?

11. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යොවන කටයුතු, කාන්තා කටයුතු ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/22)

(අ) මීගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ ඉදිකළ නව බස්නැවතුම්පල ඉදිකිරීමට දැරූ සම්පූර්ණ වියදම කොපමණද?

(ආ) මෙම බස්නැවතුම්පල තුළ කුලියට දීම සඳහා ඉදිකළ කඩ කාමර ගණන කොපමණද?

(ඇ) එකී කඩ කාමර කුලියට දීම සඳහා ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කළේද?

(ඈ) මේ වන විට එකී කඩ කාමර වලින් කුලී පදනම මත ලබාදී ඇති කඩ කාමර ගණන කොපමණද?

(ඉ) මෙම කුලියට දී ඇති කඩ කාමර වලින් පසුගිය වර්ෂය තුළ ලැබී ඇති අදායම කොපමණද?

(ඊ) මෙම බස්නැවතුම්පළ පිරිසිදු කිරීමේ වගකීම පවරා ඇති ආයතනය කුමක්ද?

(උ) මෙම බස්නැවතුම්පළ පිරිසිදු කිරීමේ වියදම වාර්ෂිකව කොපමණද?

(ඌ) එම වියදම් කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

IX. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය:

"බස්නාහිර පළාතේ 2014 අංක............... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය."

(පළමුවර කියවීම)

[2010 අංක 02 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.]

02. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය:

"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක............... දරන බදු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය."

(පළමුවර කියවීම)

[බැංකුවක් විසින් කරගෙන යනු ලබන බදු උකස් ගැනීමේ ව්‍යාපාරය හැර බදු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද ඊට ආනුෂාංගික හෝ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 2001 අංක 03 දරන බදු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්චින්න කිරීම සඳහා ද, වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බදු උකස් ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන වලට අනනුකූල වේ.]

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුල කැලි කසල, සහ අපද්‍රව්‍ය නිසි අයුරින් පාලනය කිරීම, එකතු කිරීම, බැහැර කිරීම හා එහි අතුරුඵල ලෙස විදුලි නිෂ්පාදනය කිරීම හා කොම්පෝස්ට් පොහොර නිෂ්පදනය කිරීමේ ක්‍රියාවලිය, සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය පුරා වසර 07 කට අධික කාලයක් තිස්සේ අපොහොසත් වී ඇත.

මෙම කාලය තුළ පළාතේ ප්‍රධානතම හා අත්‍යාවශ්‍යම විෂයයක් වන මෙම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීත්වය ඉහළ තත්වයක ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පළාතටම දැනී ඇත.

එම නිසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට කරගෙන යනු ලබන නගර සංවර්ධන ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරමින් මෙවැනි ව්‍යාපෘති සඳහා වඩාත් බල සහිත මූල්‍ය ශක්තියෙන් පොබී තාක්ෂණික හැකියාවක් ඇති මධ්‍යම රජය සතු නාගරික සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව යම් කාල රාමුවකට සීමා කරන ලද කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි.'

(යෝ / VI (1) / 14 / 01)

ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා :

'බස්නාහිර පළාත තුළ ජීවත් වන පාසැල් යන වයසේ දරුවන් අද දවසේ නොයෙකුත් රෝග පීඩා වලට බහුලව ගොදුරු වන අවස්ථා අප දැක ඇත. එයට බලපාන ප්‍රධාන හේතුව අයහපත් සෞඛ්‍ය පුරුදු සහ චර්යා පද්ධතිවල තිබෙන අසාමාන්‍ය වූ වෙනස්කම්ය. මේ නිසා බෝ නොවෙන රෝග වලට දරුවන් ගොදුරු වන අවස්ථා බොහෝය.

එසේම මාරාන්තික ඩෙංගු රෝගයට ද දරුවන් බහුල වශයෙන් ගොදුරු වන අතර, එයට බලපා ඇත්තේ පරිසරය පිරිසිදුවට තබා ගැනීමට අප ගන්නා උනන්දුවේ මදිකම බව පැහැදිලි වී ඇත. මෙම සියළු තත්වයන් සලකා මෙවැනි රෝග පීඩා වලින් දරුවන් ගලවා ගැනීමේ පියවරක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය (බස්නාහිර පළාතේ) එක්ව පාසල් තුල සෞඛ්‍ය සමාජ පිහිටුවා, ඒ තුලින් දරුවන් දැනුවත් කිරීම, රෝග සඳහා ඖෂධ සහ උපදෙස් ලබා දීම හා පරිසරය පිරිසිදු කිරීම වැනි කාරණා සඳහා නීතිමය රාමුවක් තුලින් මැදිහත් විය යුතුයැයි මෙම පළාත් සභාව යෝජනා කර සිටියි.'

(යෝ / VI (1) / 14 / 02)

## XI. සභාව කල් තැබීම

කේ.එච්.බී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.06.17 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.